**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2021, 2022, 2023)**

**විගණන අස්ථිත්‍යයේ නම : කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය** **2021 - තත්ත්වාගණනය කළ මතය**

**2022 - තත්ත්වාගණනය කළ මතය**

**2023 - තත්ත්වාගණනය කළ මතය**

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සභාවේ වරිපනම් තක්සේරුව වසර 14 කින් සිදු කර නොතිබුණි. | වරිපනම් බදු යාවත්කාලීන කර අයකරගත යුතු වේ. | වරිපනම් තක්සේරුව 2023 වසරේ සිදුකරන බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට කඩ කාමර 43 කින් අයවිය යුතු හිඟ එක්වන් මුදල් රු.36,230,400 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. සභාව සතු කඩ කාමර 05 ක් සම්බන්ධයෙන් ගිවිසුම් ගත වී නොතිබූ අතර, කඩ කාමර 56 ක ගිවිසුම් කල් ඉකුත් වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගිවිසුම් යාවත්කාලීන කළ යුතු වේ. | හිඟ අයකර ගැනීමට හා ගිවිසුම්ගත වීමට කටයුතු කරමින් පවතින බව. | |
| (ඇ) | සභාවට අයත් නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ගිනි ගැනීමකට ලක් වී තිබූ අතර, එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1,973,715 ක් සභාව විසින් දරා තිබුණු අතර, 2022 වර්ෂය අවසන් වන විටත් වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සභා තීරණයක් අනුව අලුත්වැඩියා කළ බව. | |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී කර්මාන්ත 04 කට අදාළව පැති බැමි හා කාණු ඉදිකිරීමේ දී අවශ්‍ය කරන පස් කැපීම සඳහා ස්කැවේටර් යන්ත්‍රය භාවිතා කර තිබුණ ද, ඒ සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා වූ මිල අනුපාතය යොදා ගැනීම නිසා වර්ග මීටර් 175 ක් සඳහා රු.93,123 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. | යන්ත්‍ර මඟින් පස් කැපීම සිදුකළ බව. |
| (ඉ) | කර්මාන්ත 2 කට අදාලව ප්ලම් කොන්ක්‍රීට් මඟින් පැති බැමි ඉදිකිරීමේ දී ඒ සඳහා පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් වැඩ (Form Work) සිදුකර තිබුණ ද, නියමිත මිල අනුපාතය යොදා නොගැනීම නිසා වර්ග මීටර් 175 ක් සඳහා රු.723,782 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කළ යුතු වේ. | මාර්ග සංවර්ධන අධිකාරිය Plywood Sheet භාවිතා කර හැඩයම් යෙදීම සඳහා ඇති එකම මිල අනුපාතය ST-63 බව. |
| (ඊ) | කර්මාන්ත 03 කට අදාළව කොන්ක්‍රීට් වැඩ සඳහා රු.18,577 ක් ද, ගල් ගොනු කිරීම සඳහා රු.34,521 ක් ද සහ රොන් මඩ ඉවත් කිරීම සඳහා රු.46,250 ක් ද වශයෙන් එකතුව රු.99,348 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අය කළ යුතු වේ. | සම්මත හා විධිමත් පරිදි කළ බව. |
| (උ) | ටී.ඩී. සමරවීර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කර්මාන්තය පස් මුට්ට කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව ඒ සඳහා රු.344,894 ක් ද, කොන්ක්‍රීට් වැඩ සඳහා නියමිත මිල අනුපාතය භාවිතා | වැඩිපුර ගෙවීම් අය කළ යුතු වේ. | පස් ප්‍රමාණය මිණුම් කිරීමේ සම්මත ක්‍රමය වන්නේ පස් මුට්ට කර මිණුම් ලබා ගැනීම |

| | | | |
|---|---|---|---|
| | නොකිරීම නිසා රු.44,432 ක් ද වශයෙන් රු.389,326 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | | බව. |
| (ඌ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,112,907 ක් අඩුවෙන් හා ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි රු.219,778 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. |
| (එ) | ප්‍රාග්ධනිත කළයුතු වටිනාකම රු.74,500 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, ප්‍රාග්ධනිත කළ නොහැකි වටිනාකම රු.51,890 ක අමතර කොටස් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. |
| (ඒ) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.12,702,185 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවියයුතු මුළු ආදායම රු.13,691,865 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.10,124,944 ක් විය. 2023 වර්ෂය සඳහා කිසිදු වරිපනම් බදු මුදලක් නොගෙවූ ඒකක 1127 ක් පැවති අතර, එම ඒකක වලින් අය වියයුතු හිඟ වරිපනම් ශේෂය රු.3,817,535 ක් විය | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. |
| (ඕ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ග්‍රාම නිලධාරී වසම් 40 ක් පැවති අතර, ඉන් ග්‍රාම නිලධාරී වසම් 37 කින් ප්‍රාදේශීය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන බදු පැනවිය යුතුය. | තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු ආදායම් අය කර ගැනීමට කටයුතු කරන |

| | | | |
|---|---|---|---|
| | සභා පනතේ 134 වගන්ති ප්‍රකාරව දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | | බව. |
| (ක) | වරිපනම් බදු තක්සේරුව 2008 වර්ෂයේ සිදුකර තිබුණු අතර, නව තක්සේරුවක් සිදු නොකිරීමෙන් සභාවට උපයාගත හැකි ආදායම් අහිමි වීමක් සිදු වී තිබුණි තිබුණි. | වර්තමාන වටිනාකම් තක්සේරු කර ආදායම් අය කල යුතුය. | තක්සේරු වාර්තාව ලද වහාම ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව. |
| (ග) | මහජ්දණ්ඩ පොළ භූමියේ අංක 17 කඩ කාමරය 2018 ජූලි මස සිටම බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු.83,700 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කාමර ටෙන්ඩර් කර බදු අය කල යුතුය. ව. | ටෙන්ඩර් කිරීමට කටයුතුකරන බ |
| (ඝ) | සභාව සතු කඩ කාමර 02 කින් 2013 වර්ෂයට පෙර සිට රු.295,368 ක මුදලක් හිඟව පැවති අතර, කඩ කාමර 122 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | දීර්ඝකාලීන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. |
| (ට) | 2015 වර්ෂයේ දී කඩ තක්සේරු කර තිබූ අතර, කඩ කාමර 198 ක තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු නොකිරීමෙන් ලැබිය යුතු කුලී ආදායම් සභාවට අහිමි වී තිබුණි. | කඩකාමරවල වර්තමාන වටිනාකම තක්සේරු කර ආදායම් අයකල යුතුය. | තක්සේරු ප්‍රතිශෝධනයන් සිදු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව. |
| (ඩ) | සවිකර ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 158 ක් වෙනුවෙන් රු.1,114,950 ක ගාස්තුවක් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ණ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.325,000 ක් හා මුද්දර ගාස්තු රු.9,332,054 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මුද්දර ගාස්තු රු.2,238,138ක් අයවීමට ඇති බව. |
| (ත) | බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද අනවසර ඉදිකිරීම් 04 කට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම හා ආවරණ අනුමැතිය ලබාදිය හැකි ගොඩනැගිලි සම්බන්ධව රු.2,580,000 ක ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබා දීමට සභාව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. |
| (ද) | ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයින්ගෙන් හිඟ ජල ගාස්තු රු.1,148,760 ක් අයකර ගැනීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ජල මීටර් 139 ක් අක්‍රිය වී පැවතුණි. | ජල මීටර් ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ බිල්පත් මුදලින් 50%ක් අයකර ගත හැකි බවත්,අක්‍රිය ජල මනු නැවත සවි කිරීමට ක්‍රියා කරන බව. |
| (න) | 2001 වර්ෂයේ දී ඉදිකර තිබුණු අතර, කුරුඳුගහ හැතැම්ම පිහිටි අඩක් නිම වූ ගොඩනැගිල්ල වසර 20 ට අධික කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා තලාද තට්ටුව (slab) තෙතමනයට ලක් වී කොන්ක්‍රීට් දුර්වල වීමේ අවධානමක් පැවති අතර, වසර 20 ට අධික කාලයක සිට අඩක් නිමකර ඇති මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යව | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. | ප්‍රධාන ඉංජිනේරුතුමා වෙතින් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරන බව. |

පැවතුණි.